## කෙටි කතාව

# කෝපය සහ කෝප්පය



**. . . . ඔහුගේ මළ ගමදී මා පවා ඔහු වෙනුවෙන් කඳුළු නොසැලුවා යැයි කීම අසත්‍යයක් නොවේ. ඒ දින කිහිපයේදී මගේ දෙනෙතින් ගළා ගියේ මා වෙනුවෙන්ම උපන් කඳුළු පමණි. මගේ හදවත නැවතී යළි පණ ලබනවාක් වැනි හැඟීමක් මට ඇති විය. තවත් කඳුළු බිඳු කිහිපයක්ම ගලා ගිය පසු මට මා වටා ඇති සියල්ලම බොඳවී පෙනුනු අතර මගේ මිය ගිය සැමියා පෙර කවරදාටත් වඩා හොඳින් මා ඉදිරියේ සිට වඩාත් පැහැදිලි, තික්ෂණ බැල්මකින් මදෙස බලා සිටිනු මම දුටුවෙමි. ඒ බැල්මේ මතුපිටින් උපේක්ෂාවත්, යටින් අනුකම්පාවත් දිස් විය. . . .**

සැමියා මිය ගිය පුවත අසන්නට ලැබුණු මොහොතේ මට දැනුනේ දුකක් නොව ඉමහත් අස්වැසිල්ලකි. කෙසේ වෙතත් ඒ සතුටු දායක පුවත මගේ හිත තුළම ගුළි කරගෙන මම හඬන වැළපෙන අන් අය හා එක්ව හැඬුවෙමි. වැළපුණෙමි. බොහෝ දෙනෙක් මා වෙත පැමිණ ජීවිතයේ යථා ස්වභාවය තේරුම් ගන්නා ලෙසත්, සිත දැඩි කරගෙන ඉදිරියට මුහුණ දීමට උත්සාහ ගන්නා ලෙසත් පවසා සිටින විට වුවද, මට ජීවිතයේ යථා ස්වභාවය තේරුම් ගැනීමේ අවශ්‍යතාවක් හෝ, ඉදිරියට මුහුණදීමට සිත දැඩි කර ගැනීමේ අවශ්‍යතාවක් හෝ කොහෙත්ම නොතිබුණි. ඔහුගේ අවසාන කටයුතු මගේ හිතට එතරම් සැළකිය යුතු බරක් ලෙස නොදැනුනේ ඇයිදැයි මම නොදනිමි. මළගමේ සියලු කටයුතු ඉබේටම මෙන් සිදුවිය. දාන මාන කටයුතුද එසේම සිදුවිය. ගමේ පන්සලේ ස්වාමීන් වහන්සේ නමක් මතක බණක් කියූ බව මට මතකය. එහෙත් මතක බණට කියූ දේ මට අමතකය. ඒ අවස්ථාවේදී ගහ කොළ සෙමෙන් සොළවා හැමූ සුළඟ ගැනත්, සිළි සිළි හඬින් ගහ කොළ සෙළවුණු හඬත්, ගතට දැණුන සිහිල් සුළඟේ පහසත් මට මතකය. එකල්හි මා නොවැදගත් කාරණා ගැන සිහියෙනුත්, වැදගත් කාරණා ගැන අසිහියෙනුත් සිටි බව නම් සැබෑය.

දැන් මට මගේ ජීවිතය මා සිතැඟි පරිදි නිදහසේ ගත කළ හැකිය. මා කැමැති තැනක යා හැකිය. නිදහසේ බණක් භාවනාවක් වුවද කර ගැනීමට එතරම් අපහසු නොවනු ඇත. මෙබඳු නිදහස් මනසකින් මා පසුගිය වසර විස්සටම එක් දිනක් හෝ ගත නොකළා නොවේදැයි මට විටින් විට සිතෙන්නට විය. විවාහයට පෙර මා විඳි නිදහස් සුන්දර ජීවිතය නැවතත් මගේ හද දොරට සෙමෙන් සෙමෙන් තට්ටු කරතියි මට සිතෙන්නට විය. ඔහු මියගොස් සතියක් දෙකක් යන තුරු එතරම් පාළුවක් හෝ කාන්සියක් නොදැණුන තරම්ය. මගේ පුතණුවන් පවා ඉඳ හිට කල්පනාවක නිමග්නව සිටින අයුරු පෙනුනද, දරා ගත නොහෙන දුකකින් කටයුතු කරන බවක් පෙනෙන්නට නොතිබුණි. ඔහු හා පුතණුවන් අතර පෙර තිබූ දැඩි ළබැඳියාව කෙමෙන් කෙමෙන් වියැකී යමින් තිබුණු සමයකය ඔහු තම දෙනෙත් සදහටම පියා ගනු ලැබුයේ. එබැවින් පුතුටද මට මෙන්ම ඔහු ගැන එතරම්ම හැඟීමක් නොතිබුණා යැයි මම සිතිමි. සැම අතින්ම එය වඩාත් හොඳට සිදුවිය. පියා වෙනුවෙන් ඔහු කඳුළු සලනු දැකීමට මම ප්‍රිය නොවිමි. සැබැවින්ම මා ප්‍රිය වූ දෙයැම සිදු වීම කෙතරම් ආශ්වය්‍යීයක්ද? පිය - පුතු සබඳතාවය දිනෙන් දින අඟලින් අඟල දැනුවත්ව සහ නොදැනුවත්ව ඈත් කිරීමට මා විසින්ද කටයුතු නොකරන ලද්දේද නොවේ.

එහෙත් අරුමයක මහත.... ! ඔහුගේ දේහය ආදාහනය කිරීමෙන් දෙසතියකට පසු මාත්, මගේ පුතුත් නිවසේ තනි වූ එක් සැදෑවක අපගේ විවාහයේ මුල් දින කිහිපයෙන් අනතුරුව වසර විස්සකට පසුව මට ඔහු කෙරහි අප්‍රමාණ දුකක් ඇති වීමට ගත වූයේ මද නිමේශයක් පමණි.

එදින හිරු බැස ගිය කල්හි නිවසේ ආලින්දයේ තිබෙන හාන්සි පුටුවේ හිඳගෙන මම කල්පනාවේ නිමග්නව සිටියෙමි. ඒ අවස්ථා-වේදී කෑම කාමරයේ විසිතුරු භාණ්ඩ කිහිපයක් තබා තිබුණු රාක්කය මගේ නෙත් හා ගැටිණ. ඒ මතින් ඇවිද ගිය මගේ දෙනෙතට මුණින් අතට නමා තිබුණු ඔහු විසින් පරිහරනය කරන ලද කෝප්පය කෙළින්ම මුණ ගැසිණ. අකුණු පහරක් වැදුණ කළක මෙන් ඒ දසුන මා තිගැස්සීමකට පත් කළේය. හදවත හිටිවනම වේගයෙන් ස්පන්දනය වන්නට විණ. මම හාන්සි පුටුවේ ඉදිරියට මදක් බරදී නැවත හාන්සි පුටුවේ පිටුපසට වී සිතේ ඇතිවුණු චකිතය මුසු කම්පනය මැඩ ගැනීමට උත්සුක වුණෙමි. මගේ සැමියාගේ ආදාහනය කරන ලද දේහය පවා මසිතේ එතරම් තදබල හැඟීමක් සහ කම්පනයක් ඇති නොකළ නමුත් ඔහු පරිහරණය කළ කෝප්පය මා මේ තරම් දරුණු දුකකට වේදනාවකට පත් කළේ ඇයි? වසර විස්සක් වූ අපේ විවාහ ජීවිතය තරමටම හෝ ඊට ආසන්න ඉතිහාසයක් මේ කෝප්පයටද ඇත. මට මතක ඇති කාලයේ පටන් ඔහු පාවිච්චි කළේද මේ කෝප්පය ය.

දිනක් සවස ඔහු පුතු තම ඇකයෙහි තුරුලු කරගෙන මෙසේ පවසනවා මට මතකය. "අපේ අප්පච්චිටත් මේ වගේ කෝප්පයක් තිබ්බා. ඒකේ රතු පාටින් සිංහයෙක් කඩුවක් අතින් අරගෙන හිටියා මෙන්න මේ වගේ...... මට තිබ්බේ නිකන් පරණ ප්ලාස්ටික් කෝප්පයක්. කැඩෙන කෝප්ප දුන්නේ ලොකු අයට විතරයි. අපේ අම්මා අප්පච්චි ගෙදර ආවම තේ කෝප්පයක් හදාගෙන ඇවිත් අත් දෙකෙන්ම දීලා පිටිපස්සට පිටිපස්සට ගිහින් උළුවස්සට හේත්තු වෙලා ආගිය තොරතුරු අහනවා. අම්මා කථා කරන්නේ අප්පච්චි කියපුවා අහගෙන ඉඳලා අන්තිමටම. අප්පච්චි තේ එක බීලා ඉවර වුණාම අම්මා අප්පච්චි ළඟටම ගිහින් අත්දෙකෙන්ම කෝප්පේ අරගන්නවා. ඊට ජ්ජසේ පස්සෙන් පස්සට ගිහින් උළුවස්ස පහු වුණාම අනික් පැත්ත හැරිලා කුස්සියට යනවා. ඉතිං මටත් ඕන වුණා කවදා හරි ලොකු වෙලා අප්පච්චි වගේ මේ වගේ තේ කෝප්පයකින් තේ බොන්න....." මා එකල බොහෝ සෙයින් ඇසීමට අකමැති වූයේ මගේ සැමියා දරුවන්ටත්, අන්අයටත් පැවසූ මෙබඳු කථාවන්ය. විශේෂයෙන් පුතාව තුරුළු කරගෙන ඔහු කථා කියන විට මා කළේ පුතාට කෑම කැවීමට හෝ නිදි කිරීමට යැයි කියා මගේ අතට ගැනීමය.

මා නූරුස්සූ අනෙක් කාරණය වූයේ ඔහු තේ බිව් පසු කෝප්පය එතනම තබා පොතක් හෝ පත්තරයක් කියවීමට අතට ගැනීමය. මේ කෝප්පය සෝදා නිසි පරිදි තැබීම අරඹයා මා විසින් ඔහුට කෙතරම් දොස් තබන්නට ඇත්ද? එහෙත් මිය යන තුරුම ඔහු මේ කෝප්පය මතු නොව වෙනත් බොහෝ දේ අරඹයාද වෙනස් නොවීය. තේ බී කෝප්පය නොසේදීම නිසා මම කිහිප වතාවක්ම ඔහු කලින් තේ පානය කළ කෝප්පය නොසෝදාම නැවතත් තේ වත් කර දුන් අයුරු දැන් සිහි වන විට එකවරම මගේ හදවත කඩා වැටෙන්නාක් මෙන් මට දැනේ. ඒ සැම වතාවකදීම කිසිම තේරුමක් නැතිව නොසේදූ කෝප්පයෙන් ඔහු තේ බොන අයුරු මා බලා සිටියේ කෝපය මුසු ප්‍රීතියකිනි.

මේ තේ කෝප්පය අරඹයා නිතර නිතර දිග ඇදුණු ආරවුල් මත දිනක් ඔහු අපූරු යෝජනාවක් කළේය. "ඔයා මට තේ හදන්න එපා. මට ඕන නම් මම උදේට හරි හවසට හරි තේ එකක් හදාගෙන බොන්නම්." ඔහු කීවේය. ඔහු එදින කතා කළේ ඉතාමත්ම පැහැදිළි ස්වරයකිනි. වචන අතර තිබූ කාල අන්තරය මා තවතවත් නොසන්සුන් කළ අතර ඔහුගේ තැන්පත් වදන් නිසා මා අපමණ වෙහෙසකටද පත්විය. ඒ හේතුවෙන් මම එකවර පිළිවෙළක් නැතිව වැඩ කිපයක් කරන්නට විමි. ඒ අතර සේදූ කෝප්ප, පිඟන් නැවත සේදීමත්, පිළිවෙළකට අස්කර තිබුණු මේසය නැවත අස් කිරීමත් විය. ඔහුගේ ඒ යෝජනාවට මගේ පිළිතුර වූයේ "හදාගෙන බැරි නම් කඩෙන් ගෙනත් හරි බීලා කෝප්පේ හෝදලා පැත්තකින් තියන්න" යන්නයි. පසු දින උදයේ මම තේ සැදුවේ මටත්, පුතාටත් පමණි. ඔහු පමාවී නැගිට කඩිමුඩියේ වැඩට යන්නට ලක ලැස්ති වී පුරුද්දට මෙන් තේ කෝප්පය සොයනු මම හොරැහින් බලා සිටියෙමි. එදින පටන් ඔහු උදේට වතුර වීදුරුවක් පමණක් බීමට පුරුදු විය. එහෙත් හවසටත්, විශේෂයෙන් රාත්‍රියටත් ඔහු නිදි නැතිව පොත් කියවන විට කහට තේ බොන්නට පුරුදු වූයෙන් ඔහු මිය යන තුරුම මෙම කෝප්ප ගැටුම විටින් විට අප ජීවිතයේ සාමන්‍ය අංගයක් බවට පත් විය.

ඔහුගේ දේහය දැවෙන විට මට මෙතරම් වේදනාවක් නොදැනුනි. මා අවසන් වරට ඔහුගේ මුහුණ දුටුවේ ඔහු අවසාන වරට අසනීප වී රෝහලට ගෙන යාමට ගිලන් රියට නංවන විටදීය. ඔහුගේ නළල හරහා වැටී තිබුණු සුදු පැහැ කෙස් රොදත් වැසුණු දෙනෙතත් එක් වරම දැන් මගේ සිතේ ඇදී ගියේ දරුණු අකුණු පහරක් මෙනි. එවෙලේ ඔහු දෙනෙත් ඇර ගෙන සිටියා නම්, කිසිසේත්ම නළල හරහා වැටුණු ඒ කෙස් රොද මා මතකයේ නොරැදෙනු නිසැකය. මම ඒ මොහොතේ ඔහුගේ සිතිවිලි කෙබඳු වී දැයි හඳුණා ගැනීමට වෙහෙසුණෙමි. ඔහු ඇති තරම් දුක් වින්දාද - නැද්ද ? ඔහු මරණයට බිය නොවූයේ ඇයි ? ඔහුගෙන් මට සිදු වූ අත පසු වීම් වලට ඔහු මරණ මොහොතේ හෝ මගෙන් සමාව අයැද නොසිටියේ ඇයි ?

මා බොහෝ සෙයින් අකමැති අනෙක් කාරණය වූයේ කුමන හෝ දෙයකට ඔහුට දොස් පැවරූ පසු ඒ ගැන වාද කිරීමෙන් අනතුරුව දින ගණනාවක් යන තුරුම මා කියන දේවල් පවා නෑසූ ගානට සිටින විටදීය. පුතු නිවසේ නොමැති විටක නම් පාන් රාත්තලක් ගේන්න කීවත් ඔහු පසු වන්නේ බීරෙකු ගාණටය. මා විවාහ වීමෙන් බලාපොරොත්තු වූයේ ලස්සන නිවසක දූ දරුවන් සමඟ ලස්සන ජීවතයක් ගත කිරීමටය. මාස කිහිපයකට පමණක් සීමා වූ අපගේ ප්‍රේමනීය විවාහ ජීවිතය ඉන් අනතුරුව පත් වූයේ හුදෙක් සාම්ප්‍රදායික විවාහ ජීවිතයක් ගාණටය. ඉන් අනතුරුව නොයේක් දේ අරඹයා අපි නිතර දෙවේලේ බහින් බස් වුණෙමු. කිසි දිනක, කිසි යම්ම දෙයක් ගැන හෝ එකඟතාවයකට නම් පත් නොවූයෙමු. ඔහු නොයේක් දේවල් පිළිබඳ තීරණ ගත්තේ බොහෝ කල් වේලා ගෙනය. මගේ උනන්දුවත්, උත්සාහයත් නොවූයේ නම් අපට ජීවත් වීමට කියා ගෙයක් දොරක් පවා තිබෙනු ඇතැයි සිතීමත් දුෂ්කරය. නිතරම කල්පනාවේ නිමග්න වූ මගේ සැමියාට නිතරම නිවසේ වැඩ කටයුතු අමතක විය. එහෙත් රටේ ලෝකේ දේවල් ගැන දින වකවානුත් සමඟ හැම දේම මතක තිබුණි. ඔහුගේ තිබුණු අඩුපාඩු ගැන පොතක් ලිවීමට තරම් කරුණු තිබෙන බව සිතමින් සිටින විට නැවත වතාවක් සාලයේ හිඳ ගෙන සිටින විට මට ඔහු පරිහරණය කරන ලද කෝප්පය දිස් විය. එය නැවත වතාවක් නොපෙනෙන පරිදි සඟවා තැබීමට සිතා මම කෑම කාමරය දෙසට අඩියට දෙකට පිය මැන්නෙමි.

ඔහුගේ කෝප්පය අතට ගන්නවාත් සමඟම මගේ මුළු ඇඟම කිළි පොළා ගියේය. පරිසරය ශීත වුවද කෝප්පය දැඩි උණුසුමින් යුතු විය. කෝප්පය සඟවනවා වෙනුවට මා එය මගේ ළමැඳට එය තුරුළු කර ගත්තේ මටත් සොරාය. මට මා වටා වූ සියල්ලම කැරකෙනවා මෙන් දැනුනි. මටත් නොදැනීම මගේ දෙනෙතින් ගළා ආ කඳුළක් කෝප්පය තුළට වැටුණි. "මං වෙනුවෙන් අඬන්න දුක් වෙන්න කෙනෙක් නෑ. ඒ නිසා මට කවදා වුනත් මැරෙන්න එච්චර අමාරුවක් වෙන එකක් නෑ." දිනක් ඔහු තම මිතුරෙකු සමඟ මධුවිත තොළ ගාන අතර කියූ අයුරු මට සිහිපත් විය. මේ මොහොත වෙන තුරු එය සැබෑවක් විය. ඔහුගේ මළ ගමදී මා පවා ඔහු වෙනුවෙන් කඳුළු නොසැලුවා යැයි කීම අසත්‍යයක් නොවේ. ඒ දින කිහිපයේදී මගේ දෙනෙතින් ගළා ගියේ මා වෙනුවෙන්ම උපන් කඳුළු පමණි. මගේ හදවත නැවතී යළි පණ ලබනවාක් වැනි හැඟීමක් මට ඇති විය. තවත් කඳුළු බිඳු කිහිපයක්ම ගලා ගිය පසු මට මා වටා ඇති සියල්ලම බොඳවී පෙනුනු අතර මගේ මිය ගිය සැමියා පෙර කවරදාටත් වඩා හොඳින් මා ඉදිරියේ සිට වඩාත් පැහැදිලි, තික්ෂණ බැල්මකින් මදෙස බලා සිටිනු මම දුටුවෙමි. ඒ බැල්මේ මතුපිටින් උපේක්ෂාවත්, යටින් අනුකම්පාවත් දිස් විය. මම බොහෝ කාලයකට පසු ඔහුගේ දෙනෙත දිහා ඍජුව බැලුවෙමි. ඔහුගේ දෙනෙත අති දීප්තිමත්ය. එමෙන්ම සුපැහැදිලිය. සුදු පැහැති කෙස් රොදක් ඔහුගේ නළල හරහා වැටී තිබුණි.

මම වහාම වතුර දමා කේතලය රත් වන්නට තැබුවෙමි. වතුර උතුරණ විට හොඳින් තේ කොළ දමා සීනි හැන්දක් හා කිරිපිටි හැඳි එක හමාරක් දමා ඔහුගේ කෝප්පයටම තේ එකක් හැදුවෙමි. ඉන් පසු මදක් තොළ ගා බැලුවෙමි. එය මා එතෙක් මෙතෙක් සාදන ලද හොඳම තේ කෝප්පය නොවේදැයි මට සිතුණි. මම දැතින්ම තේ කෝප්පය ගෙන ඔහුට පිළිගන්වන්නට ඔහු දෙසට හැරී බැලුවෙමි. ඒත් තේ කෝප්පය පිළිගන්වන්නට ඔහු එතැන නොසිටියේය. මට ක්ෂණයකින් නැවත සිහි එළඹිණ. මෙවර මගේ දෙනෙතින් ගලා ආවේ කඳුළු ගංගාවකි. මම තේ කෝප්පය මුළු තැන්ගෙයිම තබා වහා ඔහුගේ කාමරයට දිව ගොස් ඔහු කාර්යාලයට ඇඳි කමිසයක් අතට ගෙන මගේ මුහුණ වසා ගතිමි. මට මහා හය්යෙන් හැඬුම් ආවේය. ඔහුගේ සුවඳ මගේ හදවතේ අන්තිම කොණේ පවා දැවටුණේය. ඔහුගේ කමිසයෙන් නොකඩවා හදවතින්ම නැගෙන කඳුළු පිසගත් මම ලද අස්වැසිල්ලෙන්, නැවත ඇස් ඇර ඔහුගේ කමිසය දෙස හොඳින් බැලුවෙමි. කමිසයේ බොත්තම් කිහිපයක්ම නොතිබුණ අතර ඒ අතර එක් හැට්ට කට්ටක්ද ගසා තිබුණි.

**සාමන්ත තැන්නගේ**